# නූර්ති ගීත ගායනය

හත්වන ශ්‍රේණියේ අවසාන වාරයේ සිටින ඔබට මේ වන විට නූර්ති නමින් හඳුන්වන නාට්‍ය විශේෂය පිළිබඳ යම් දැනුමක් ලැබී තිබෙනවා. මේ වන විට ඔබ ගායනය කර ඇති නූර්ති ගීත කිහිපයක් පිළිබඳ අපි ආවර්ජනය කරමු.

| ගීතය | අයත් නූර්තිය | නූර්ති නිෂ්පාදයකයා |
|---|---|---|
| අද වෙස්සන්තර රාජ පුතා | වෙස්සන්තර නූර්තිය | ජෝන් ද සිල්වා ශූරීන් |
| සුවඳ පත්ම ඕලු ආදී | දුටුගැමුණු නූර්තිය | ජෝන් ද සිල්වා ශූරීන් |
| මෙම ගිම්හාන ග්‍රීස්ම වු කාලේ | විධුර නූර්තිය | චාල්ස් ඩයස් ශූරීන් |
| අඹ දඹ නාරං | රාමායණය නූර්තිය | ජෝන් ද සිල්වා ශූරීන් |
| දන්න වං හුං අප කන්නසාමි | ශ්‍රී වික්‍රම රාජසිංහ නූර්තිය | ජෝන් ද සිල්වා ශූරීන් |

මේ එවැනි තවත් නූර්ති ගීයක් .

**දම් වැසි වස්සන**

**නූර්තිය - විධුර**

**නිෂ්පාදක - නීතිඥ චාල්ස් ඩයස්**

දම් වැසි වස්සන ලෝකේ විධුර පඬි
නොදුක වී ය මා ළය සෝකේ විධුර පඬී

රෝග ලීලා දක්වලා ප්‍රයෝගෙන්
ගෙන්වමි ඒ පඬිඳුන් මෙහි නා ලෝ
ශ්‍රවණ කරණ සේ මධුර බණ කථා
එතුමාගේ විධුර පඬී

දම්වැසි......

දම්වැසි වස්සන 4/4 C minor

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ථායි | ප | ධ | ප | ම | ග | රි | ස | රි | නි | ස | ග | ම | ගම | පධ | පම | ප |
| | රි | ම | ග | රි | ස | - | - | - | ප | ධ | ප | ම | ග | රි | ස | රි |
| | නි | ස | ග | ම | ගම | පධ | පම | ප | රි | ම | ග | රි | ස | - | - | - |
| අන්තරා | + | ප | -ප | ප | - | ම | ග | ම | ප | ධ | ප | ම | ග | රි | ස | - |
| | + | ප | -ප | ප | - | ම | ග | ම | ප | ධ | ප | ම | ග | රි | ස | - |
| | + | පප | -ස් | ස් | ස් | - | ස් | ස් | නිස් | ස්නි | නිනි | ර්ර්ස් | නි | ධ | ප | - |
| | ප | ධ | ප | නි | ධ | ප | ම | - | ම | ප | ම | ධ | ම | ප | ගරි | ස |
| | නි | ස | ග | ම | ගම | පධ | පම | ප | රි | ම | ග | රි | ස | - | - | - |

වැඩිහිටියන්ගේ උදව් උපකාරය ලබාගෙන අන්තර්ජාලය ඔස්සේ මෙම ගීතය ශ්‍රවණය කරන්න උත්සහ කරන්න. එය අනුකරණය කරමින් ගයන්න. ස්වර ප්‍රස්ථාරය දෙස බලා වාදකය කැන්නට උත්සහ කරන්න. මෙම නූර්තියට පාදක වූ ජාතක කතාව වැඩිහිටියෙකුගෙන් අසා දැනගෙන්න.

පහත දැක්වෙන ප්‍රශ්නවලට පිලිතුරු සපයන්න.

1. මෙම ගීතය අයත් නූර්තිය කුමක්ද?
2. මෙම ගීතය අයත් නූර්තියේ ඇති, ඔබ දන්නා වෙනත් ගීතයක් නම් කරන්න.
3. මෙම නූර්තියට පාදක වූ කතාවේ ඔබ දන්නා චරිත 5ක නම් ලියන්න.
4. නූර්ති නිෂ්පාදකවරුන් දෙදෙනෙකුගේ නම් ලියන්න.